
# වාර්ෂික වාර්තාව
# සහ ගිණුම්
# 2013

SOSEBO

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

### මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය




සමාජ ආරක්ෂණ පියස, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.

# පූර්විකාව


I දැක්ම හා මෙහෙවර 1

II සභාපතිතුමියගේ පණිවිඩය 2

III සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවිඩය 3

IV හිටපු සභාපතිවරු, සාමාන්‍යාධිකාරීවරු හා වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය 4

V ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - සංවිධාන සටහන 5

VI ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය 6

1. **පාලන අංශය** ---------- 7

1.1 ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම 7

1.2 අනුමත කාර්ය මණ්ඩල හා පුරප්පාඩු 7-8

1.3 අනුමත කාර්ය මණ්ඩල වැඩිකිරීම හා පුරප්පාඩු පිරවීම 9

1.4 2013 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම් 9

1.5 පාලන අංශයේ වර්තමාන කාර්ය මණ්ඩලය 9

1.6 භෞතික සම්පත් 10

1.7 සන්නිවේදන පහසුකම් 10

1.8 ප්‍රවාහන පහසුකම් 10

1.9 වාහන විස්තර 11

1.10 පාලන අංශය 11

1.11 පරිගණක ඒකකය 12

1.12 2013 වර්ෂයේ සිදුකළ කාර්යයන් 12

2. **සමාජ ආරක්ෂණ අංශය** ---------- **13**

2.1 සමාජ ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන් 13

2.2 සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල 13

2.3 යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධවන නිලධාරීන් 14

2.4 සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2013 වර්ෂය දිස්ත්‍රික් අනුව බඳවාගැනීම 15

2.5 2013 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් 16

2.6 2013 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල් 16

2.7 2013 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම වැඩසටහන් 16

2.8 සමාජ ආරක්ෂණ අංශයේ ගැටළු 16

3. **මුදල් අංශය** ---------------------------------------------------------------------------- **17**

3.1 පොදු කරුණු 17

3.2 මුදල් අංශයේ කාර්ය මණ්ඩලය 17

4. **අභ්‍යන්තර විගණක අංශය** ------------------------------------------------------------ **18**

4.1 විෂයපථය 18

4.2 කාර්යභාරය 18

4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 19

4.4 2013 වර්ෂයේදී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා 19

4.5 අභ්‍යන්තර විගණන අංශයේ තනතුරු හා පුරප්පාඩු 20

5. **ස්තුතිය** ------------------------------------------------------------------------------------ **21**

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## දැක්ම

සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්

## මෙහෙවර ප්‍රකාශය

අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය තුළින් යහපාලන ප්‍රතිපත්ති වලට අනුගත වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සුරක්ෂිතභාවය වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනගමින් තිරසාර සංවර්ධනයක් කරා....

# සභාපතිතුමියගේ පණිවිඩය

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ " මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සමාජ ආරක්ෂණය සඳහා වූ ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවමින් හා ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය උදෙසා ශක්තිමත් අඩිතාලමක් දැමූ සුවිශේෂි වසරක් ලෙස 2013 වර්ෂය හැඳින්විය හැකිය.

රාජ්‍ය විශ්‍රාම වැටුපක් නොලබන සියළුම පුරවැසියන්ට විශ්‍රාම වැටුපක් ලබා දීමේ සැලසුම ක්‍රියාවට නංවන එකම රාජ්‍ය ආයතනය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය බව ඉතා නිහතමානීව හඳුන්වා දීමට කැමැත්තෙමි. "සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය" දිගුකාලීන ප්‍රතිලාභ සහිත වැඩසටහනකි. එහිදි සාමාජිකයන්ගේ විශ්වාසය තහවුරු කිරීමත්, යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරන නිලධාරින්ට සේවා පහසුකම් ඇති කිරීමත් ඉතා වැදගත් වේ. ඒ අනුව ප්‍රතිලාභීන් සමග දීර්ඝ කාලීන සබඳතා තහවුරු කර ගැනීමට පහසුකම් සලසමින් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර නිවහනක ස්ථාපිත කිරීමට ලැබීම අප ලද ජයග්‍රහණයකි. එම කාර්යයේදි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ලබා දුන් මග පෙන්වීම හා සහය දුන් සැමට ප්‍රණාමය පුද කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

මණ්ඩලයේ කාර්යයභාරය ක්‍රියාවට නැංවීමේදි මුහුණ දුන් අභියෝග රාශියකි. ඒ සියල්ල ජය ගනිමින් "සුරුකුම" යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරමින් හා එයට පූර්ව සැලසුමක් ලෙස 2012 වර්ෂයේදි "ආරස්සාව" නමින් යෝජනාක්‍රමයක් හඳුන්වා දෙමින් 2013 වර්ෂයේදි එම නව සංකල්පයට ඉහළ ප්‍රතිචාරයක් ලබා ගැනීම අප ලද ජයග්‍රහණයකි. ජනගහන ව්‍යුහය තුළ වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතය සිඝ්‍රයෙන් ඉහළ යෑම පිළිබඳව මෙම මණ්ඩලය විසින් ඇති කරන ලද පුළුල් සංවාදය තුළ "සමාජ ආරක්ෂණය" සැමගේ අවධානයට ලක්ව තිබේ. මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිතව ඵලදායි වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

"සමාජ ආරක්ෂණය" යනු විශ්‍රාම වැටුප් යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම පමණක් නොව පුද්ගලයන්ගේ උපතේ සිට මරණය දක්වාත් ඉන්පසු යැපෙන්නන් වෙත සුරක්ෂිතභාවය ඇති කරමින් මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ සහතික කිරීමේ පුළුල් කාර්යභාරයක් පිළිබඳ අවධානය යොමු කළ යුතු පුළුල් විෂයකි. ඒ පිළිබඳවද අවධානය යොමු කරමින් 2014 -2018 කාල පරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්ම සකස් කරමින් ඉදිරි වර්ෂ 05 සැලසුම් කිරීමට ලැබීමද සුවිශේෂි කාර්යයකි.

මෙම සියලු කාර්යයන් ඉටුකිරීමේදි අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් මැදිහත්වීම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා හා වෙනත් අමාත්‍යවරුන් ලබා දුන් සහය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ සේවා නිලධාරින්, ග්‍රාම නිලධාරින් හා අනෙකුත් රාජ්‍ය නිලධාරින් ලබා දුන් ක්‍රියාශීලි සහයෝගය මෙන්ම සමස්ත කාර්යය මණ්ඩලයේ කැපවීමද අගය කරමි.

"සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිතවූ අභිමානවත් ජාතියක්" යන මණ්ඩලයේ දැක්ම යථාර්ථයක් කර ගැනීමට සැමගේ සහය අපේක්ෂා කරමි.

නීතිඥ සුමනා ආරියදාස
සභාපතිනි

පිටු අංක 03

# සාමාන්‍යාධිකාරිතුමාගේ පණිවිඩය

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත හා 1999 අංක 33 සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මගින් ස්ථාපිත වූ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සිය 18 වන වියට එළඹෙමින් තිබේ.

මණ්ඩලය ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණය පිළිබඳව ලද අත්දැකීම් හා වර්තමාන ආර්ථික, සමාජමය, සංස්කෘතික හා දේශපාලන වටපිටාව පිළිබඳව සලකා බලන විට ඉතා පුළුල් කාර්යභාරයක් ඉටු කිරීමේ වගකීම පැවරී තිබේ. සභාපතිනි නීතිඥ සුමනා ආරියදාස මැතිණියගේ නායකත්වය යටතේ ඒ සඳහා ඉතා ශක්තිමත් අඩිතාලමක් දැමීම 2013 වර්ෂයේදි සිදුවූ බව ඉමහත් සතුටින් සඳහන් කරමි.

2013 වර්ෂයේදි සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට බඳවාගත් නව සාමාජික සංඛ්‍යාව 9248 කි. ඒ අනුව 2013.12.31 දිනට මුළු සාමාජික සංඛ්‍යාව 456,005 කි. එයින් මාසික විශ්‍රාම වැටුප් ලැබූ සංඛ්‍යාව 15,527 කි. යෝජනාක්‍රමයේ ප්‍රතිලාභ වන විශ්‍රාම වැටුප්, අර්ධ හා පූර්ණ අබලතා ප්‍රතිලාභ, මරණ පාරිතෝෂික යන ප්‍රතිලාභ එකඟවූ පරිදි කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවීම් කරමින් සාමාජික විශ්වාසය තහවුරු කරගැනීමට හැකි වී තිබේ.

2013 වර්ෂයේදි සකස් කරන ලද 2014-2018 කාලපරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්ම තුළින් මණ්ඩලයේ කාර්යභාරය තවදුරටත් පුළුල් කරමින් කටයුතු කිරීමට සැලසුම් කර ඇති අතර, භෞතික සම්පත්, කළමනාකරණ, මානව සම්පත්, තොරතුරු තාක්ෂණ ආදී සෑම අංශයක්ම ශක්තිමත් කිරීමටද අවධානය යොමු කර ඇත.

වර්තමානයේදි මුළු ජනගහනයෙන් 12.2 % ක් පමණ වන වයස අවුරුදු 60 ඉක්මවූ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහනය වර්ෂ 2029 වන විට 25% ක් දක්වා ඉහළ යන බවට ඇස්තමේන්තු කර ඇත. මෙහිදි ඇතිවන ආර්ථික, සාමාජීය අභියෝග ජය ගැනීමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට සුවිශේෂී කාර්යභාරයක් ඉටුකළ හැකිය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ශක්තිමත්ම සමාජ ආරක්ෂණ වැඩසටහන ඇත්තේ මෙම මණ්ඩලයටයි.

2013 වර්ෂය අවසාන වන විට මුලතිව් හා මන්නාරම දිස්ත්‍රික් හැර සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කරමින් කාර්යභාරය පුළුල් කර ඇති අතර, මෙම කාර්යභාරයේදි සභාපතිතුමිය, අධ්‍යක්ෂ මණ්ඩලය, හා සමස්ත කාර්ය මණ්ඩලය ඉටු කරන සේවය හා කැපවීම අගය කරමි.

සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහය දක්වන සියලුම රාජ්‍ය නිලධාරින්ගේ සේවය අගය කරන අතර, ඔවුන්ගේ නිරන්තර සහයෝගය මෙම මණ්ඩලයට මහත් ශක්තියකි.

ධම්මික පාදුක්ක
සාමාන්‍යාධිකාරි

පිටු අංක 04

## හිටපු සභාපතිවරු

**නම**

වී. ජෙගරාසසිංගම් මහත්මිය
එස් කාරියවසම් මහතා
කේ. ජයලත් මහතා
ආර්.එම්.ඩී.බී. බෝගහකුඹුර මහතා
ආනන්ද ගාල්ලෙආරච්චි මහතා
ඩී.කේ.ආර්. වීරසේකර මහතා
ලක්ෂ්මන් හිරිමුතුගොඩ මහතා
සුනිල් සමරවීර මහතා (වැ.බ)
සරත් කීර්තිරත්න මහතා
නිමල් චන්ද්‍ර අමරසිංහ මහතා

## හිටපු සාමාන්‍යාධිකාරිවරු


**නම**

රණතුංග හේමචන්ද්‍ර මහතා
අශෝක පීරිස් මහතා
බී.ඒ. සෝමපාල මහතා
කේ.ජී.ජී. විජේවර්ධන මහතා
පී.ඊ.සී. නේසයියා මහතා
ජේ. එම්. විජයරත්න මහතා
එන්.ජේ.පතිරණ මහත්මිය
කේ.එන්.ජේ. කුරේ මහතා

## අධ්‍යක්ෂ මණ්ඩලය — 2013 වර්ෂය

| නම | තනතුර |
|---|---|
| නීතිඥ සුමනා ආරියදාස මහත්මිය | සභාපතිනි |
| මොන්ටේගු සරච්චන්ද්‍ර මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| ලාල් වීරසිංහ මහතා | අධ්‍යක්ෂ |
| එල්.ඒ.රූපසිංහ මහතා | අධ්‍යක්ෂ |
| මහින්ද සෙනරත් බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ |
| ජේ.ඩී.විජේකෝන් දිසානායක මහතා | අධ්‍යක්ෂ |
| ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ (භාණ්ඩාගාර නියෝජිත) |

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන සටහන



පිටු අංක 06

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පනතේ විධිවිධාන ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහල හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට "සුරැකුම" යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන්ට දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.
2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය"ට සමගාමීව "ආරස්සාව" පූර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වාදෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/භාරකරු භාරකාරත්වය යටතේ සාමාජික කළහැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

## යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවයකදී වයස අනුව ගැලපූ රු. 25000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර අබලතාවයකදී වයස අනුව ගැලපූ රු. 50000 දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතා දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ග්‍රාම නිලධාරීන් මඟින් හා වෙනත් බලය පවරන ලද නිලධාරීන් මගින් සිදුකල හැකිය.

වාරික ගෙවීම, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරීන් මඟින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මඟින් සිදුකලහැකිය.

පිටු අංක 07

# 1. පාලන අංශය

## 1. 1. ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම්

1996 වර්ෂයේදී සුවසිරිපායේ පිහිටි සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයේදී 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල පනත යටතේ 1996 ඔක්තෝම්බර් මස 16 වන දින ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව බොරැල්ලේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල තුළ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී.

1997 මාර්තු මාසයේදී කොළඹ 06, ගාලු පාරේ, අංක. 585 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත කුලියට ගෙන මණ්ඩල කාර්යාලය එහි පිහිටුවීම දෙවන අදියර යටතේ සිදුවිය. අනතුරුව 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල (සංශෝධන) පනත මගින් මුල් පනත සංශෝධනය කරන ලදී. ඊට අනතුරුව 2003.07.01 දින සිට නුගේගොඩ, නාවල පාරේ, අංක. 150 ඒ දරණ ස්ථානයේ කාර්යාලය ස්ථාපනය කරන ලදී. ඊට පසු 2010.04.30 දින සිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ 2010.12.01 වන දින සිට අංක. 125, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කරන ලදි. 2013.03.06 දින ප්‍රධාන කාර්යාලය අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ලිපිනයේ මණ්ඩලය විසින් මිලදිගත් ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලද අතර, එය "සමාජ ආරක්ෂණ පියස" ලෙස නම් කෙරිණි. මෙමගින් වඩාත් විශ්වාසදායි හා කාර්යක්ෂම සේවාවන් සැපයීමට හැකියාව ලැබී තිබේ. වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර සේවා කටයුතු වඩාත් පුළුල් කර ඇත.

## 1.2. අනුමත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු

අතිගරු ජනාධිපතිතුමියගේ ලේකම් වෙත ආමන්ත්‍රිත, වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවේ සභාපතිතුමාගේ අංක. එස් ආර් 35/339 හා 1997 ජූලි 17 දින දරණ ලිපියෙන්, ඉල්ලුම්කර තිබූ සේවක මණ්ඩල බඳවාගැනීම අදියර කීපයකට වෙන්කරන ලෙසත් , 1997 වර්ෂය තුළ තනතුරු 56 කට පමණක් පත්වීම් කිරීම ප්‍රමාණවත් බවත් නිර්දේශ කර තිබුණි. 1997 සැප්තැම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එකී නිර්දේශය අනුමත කරන ලද අතර, කාර්ය මණ්ඩලය 159 ක් දක්වා බඳවා ගැනීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව පසුව මහා භාණ්ඩාගාරය විසින් සේවක සංඛ්‍යාව 88 ක් දක්වා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. 1999 සිට වරින්වර සේවක මාරුවීම්, ඉල්ලා අස්වීම් නිසා පුරප්පාඩු දිගින් දිගටම පැවති අතර, දැනට සේවයේ යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය 105 දෙනෙකි. තනතුරු අනුව එම සේවක සංඛ්‍යාව බෙදී ඇති අයුරු පහත දැක්වේ. කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම මත ආයතනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා නොවන බැවින්, කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා 180 කින් සමන්විත නව කාර්යමණ්ඩලයක් සඳහා අනුමැතිය ලබාදී ඇති අතර, අදාළ බඳවාගැනීමේ පරිපාටිය සකස්කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.09.14 දින කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන ලදී. දැනට පවතින තනතුරු අන්තර්ග්‍රහණය කර ඇති අතර, පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට බඳවාගැනීම් කටයුතු සිදු කරමින් පවතී.

පිටු අංක 08

## කාර්යය මණ්ඩල විශ්ලේෂණය. — 20 13 වර්ෂය

| තනතුර | අනුමත ගණන | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 01 | - | 01 |
| නි.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 01 | 01 | - |
| නි.සාමාන්‍යාධිකාරී (මුදල්) | 01 | 01 | - |
| ස.සාමාන්‍යාධිකාරී (මුදල්) | 01 | 01 | - |
| ස.සාමාන්‍යාධිකාරී (රක්ෂණ/විශ්‍රාම වැටුප්) | 01 | - | 01 |
| ස.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 01 | 01 | - |
| ස.සාමාන්‍යාධිකාරී (පාලන) | 01 | 01 | - |
| අභ්‍යන්තර විගණක | 01 | - | 01 |
| කළමණාකරු (පාලන) | 01 | 01 | - |
| කළමණාකරු (තොරතුරු තාක්ෂණ) | 01 | - | 01 |
| කළමණාකරු (ප්‍රවර්ධන) | 01 | 01 | - |
| කළමණාකරු (ඔප්පු සේවා) | 01 | 01 | - |
| කළමණාකරු (රක්ෂණ) | 01 | 01 | - |
| කළමණාකරු (විශ්‍රාම වැටුප්) | 01 | 01 | - |
| කළමණාකරු (මුදල්) | 01 | 01 | - |
| කළමණාකරු (රැස් කිරීම්) | 01 | - | 01 |
| ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරීන් | 06 | - | 06 |
| අභ්‍යන්තර විගණන නිලධාරීන් | 02 | 02 | - |
| සම්බන්ධීකරණ නිලධාරීන් | 49 | 42 | 07 |
| විමර්ෂණ නිලධාරීන් | 02 | - | 02 |
| දත්ත පරිපාලක | 01 | - | 01 |
| පොත් තබන්නා | 02 | 01 | 01 |
| පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග) | 01 | - | 01 |
| පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග) | 01 | 01 | - |
| කළමණාකරණ සහකාර | 57 | 36 | 21 |
| රියදුරු | 09 | 07 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 34 | 21 | 13 |
| **එකතුව** | 180 | 121 | 59 |

**කොන්ත්‍රාත් පදනම මත සේවය කරන කාර්ය මණ්ඩල**

- සම්බන්ධීකරණ නිලධාරී - 01
- කළමණාකරණ සහකාර - 05
- රියදුරු - 02
- කාර්යාල කාර්ය සහායක - 06

14

## 1.3. අනුමත කාර්ය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම

මණ්ඩලයේ ඉලක්කගත අරමුණු හා පරමාර්ථ ලහාකරගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය ස්ථාපිත කිරීමත් පුහුණුව හා සංවර්ධනය තුළින් ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම, සිදුකරනු ලබන අතර, පුරප්පාඩු පිරවීම මඟින් ඉහළ සේවා ඵලදායිතාවයක් ලහාකර ගැනීමටත් කටයුතු සිදුකෙරේ.

## 1.4. 20 13 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම

| නම | තනතුර | | |
|---|---|---|---|
| එච්.පී.ඩී.කාංචනා පතිරාජ මෙනවිය | පුද්ගලික සහකාර | - | සේවය අත්හැර යාමකි. |
| පී.ඩබ්.එස්.වසන්ත කුමාර මයා | අභ්‍යන්තර විගණක | - | ඉල්ලා අස්වීමකි |
| සී.ඩබ්.එම්.සී.ධර්මකීර්ති මයා | සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) | - | ඉල්ලා අස්වීමකි. |
| නිමල් චන්ද්‍රතිලක මයා | කාර්යාල කාර්ය සහයක | - | ඉල්ලා අස්වීමකි. |
| අශෝක උදයකුමාර මයා | පරිගණක වැඩසටහන් සහකාර | - | ඉල්ලා අස්වීමකි. |
| රනිල් පෙරේරා මයා | රියදුරු | - | සේවය අත්හැර යාමකි. |
| නිලූෂා වෙරෝනිකා මිය | කාර්යාල කාර්ය සහයක | - | ඉල්ලා අස්වීමකි. |
| එම්. තයාමනී මිය | සම්බන්ධීකරණ නිලධාරි | - | සේවය අත්හැර යාමකි. |
| ඩබ්.නලින් ක්‍රිෂාන්ත මයා | කළමනාකරණ සහකාර | - | ඉල්ලා අස්වීමකි. |
| එම්. රාජතුරෙයි මයා | සම්බන්ධීකරණ නිලධාරි | - | ඉල්ලා අස්වීමකි. |

## 1.5. පාලන අංශයේ වර්තමාන කාර්ය මණ්ඩලය

| තනතුර | සිටින |
|---|---|
| ස.සාමාන්‍යාධිකාරි (පාලන) | 01 |
| කළමණාකරු (පාලන) | 01 |
| කළමණාකරණ සහකාර | 04 |
| කා.කා.ස. | 02 |
| පණිවිඩකරු | 01 |
| රියදුරු | 06 |
| **එකතුව** | **15** |

## 1.6. භෞතික සම්පත්

ප්‍රධාන කාර්යාලය - 2013 මාර්තු මස 06 දින අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි මහල් 04 කින් යුත් මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - 2013.12.31 වන විට මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්ක හැර අනෙකුත් දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

## 1.7. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකථන පද්ධතිය වැඩිදියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03 ක් ෆැක්ස් ප හසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබාගෙන ඇත.

| | | | |
|---|---|---|---|
| සභාපති | - | සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක් | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | - | සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක් | |
| සාමාන්‍යාධිකාරී | - | සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක් | |
| නි.සාමාන්‍යාධිකාරී 02 | - | දුරකථන හා ෆැක්ස් අංක 02 | |
| ස.සාමාන්‍යාධිකාරී 03 | - | දුරකථන | 03 |
| අභ්‍යන්තර විගණක | - | දුරකථන | 01 |
| තැපැල් කටයුතු | - | දුරකථන | 02 |
| ක්ෂණික ඇමතුම් | - | දුරකථන | 01 |

ඉහත දුරකථන සම්බන්ධතා වලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 22 ක් සඳහා ද දුරකථන පහසුකම් ලබාදී ඇත.ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත පද්ධතිය ස්ථාපිත කරන ලද අතර, VPN පද්ධතියක් හරහා දිස්ත්‍රික් කාර්යාල වෙත ජාලගත කරමින් සේවා කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමට පියවර ගෙන ඇත.

## 1.8. ප්‍රවාහන පහසුකම්

මණ්ඩලයේ වැඩ කටයුතු ආරම්භ කළ අවස්ථාවේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පාවිච්චි කළ වාහන දෙකක් මණ්ඩල කාර්යයන් සඳහා යොදවන ලදී. ඉන්පසුව අතිරේක වාහන දෙකක් ද සමාජ සේවා අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇත. 1997/98 වර්ෂ වලදී වාහන 05 ක් මිලදී ගෙන ඇත. මෙම වාහන සියල්ල ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අධික අළුත්වැඩියා වියදමක් දැරීමට සිදු විය. 2006 වර්ෂය අවසාන වන විටත් මණ්ඩලය සතුව පැවතියේ වාහන 07ක් පමණි. ඒවා දැනට ධාවන තත්ත්වයේ පවතී. අවස්ථා ගණනාවකදීම නව වාහන අවශ්‍යතාවය පෙන්වා දුන් අතර, 2008 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයට වාහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීමෙන් පසු රේගුවෙන් නිදහස් කර ගත් වාහනයක් ලබාගන්නා ලෙස උපදෙස් ලැබුණි. ඒ අනුව මෝටර් රථය ලබාගන්නා ලදී. 2010 වසරේ වාහන 02 ක් මිලදී ගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළ අතර, මුදල් වෙන්කිරීමෙන් පසු මයික්‍රෝ ආයතනයෙන් මයික්‍රෝ රයිනෝ වර්ගයට අයත් වාහන 02 ක් මිලදීගන්නා ලදී.

250-6090 කැබ් රථය හා 32-4987 පාත් පයින්ඩර් ඉතා පැරණි තත්ත්වයේ තිබූ අතර, එම වාහනය වෙන්දේසි කර විකිණීමට කටයුතු කරන ලදී.

2013 වර්ෂයේදි නිසාන් ජූක් කාර් රථයක් මිලදි ගත් අතර, තවත් වෑන් රථයක් මිලදි ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

## 1.9. දැනට තිබෙන වාහනවල විස්තර පහත දැක්වේ

| වාහන අංකය | වර්ගය | පළමුව ලියාපදිංචි කල දිනය | ඉතා හොඳයි | හොඳයි | අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවති | අබලන් | ගර්හිත |
|---|---|---|---|---|---|---|---|
| 250 - 6095 | ඩබල් කැබ් | 1997.10.24 | | | ✔ | | |
| 252 - 5463 | ඩබල් කැබ් | 1998.08.14 | | | ✔ | | |
| 253 - 2796 | ලයිට්ඒස් | 1999.07.06 | | | ✔ | | |
| 253 - 2818 | කැරවෑන් | 1999.07.06 | | | ✔ | | |
| KH - 4506 | කාරය | 2008.09.30 | | ✔ | | | |
| KN- 0014 | මයික්‍රෝ ජීප් රථය | 2011.01.13 | | අනතුරකට ලක්ව ධාවනයෙන් ඉවත්කරන ලද අතර, රක්ෂණ වන්දි ලබා ගන්නා ලදි | | | |
| KN - 0006 | මයික්‍රෝ ජීප් රථය | 2011.01.13 | | ✔ | | | |
| KX –0914 | නිසාන් ජූක් කාර් | 2013.10.17 | ✔ | | | | |

## 1. 10. පාලන අංශය

**විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු**

- **මානව සම්පත් ඌණතා**

1. පිරිස්බල තක්සේරුව හා බඳවා ගැනීම් පරිපාටිය අනුමත වී ඇති අතර, පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුව ඇත.
2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඉතා කඩිනමින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම අවශ්‍යව පවතී.

- **භෞතික සම්පත් ඌණතා**

01. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධිකවීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධිකවන නිසා නව වාහන මිලදී ගැනීමට කටයුතු කිරීම.
02. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීම සඳහා , භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.
03. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ තවදුරටත් සිදුකළ යුතු වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කිරීම.

## 1.11. පරිගණක ඒකකය

### ප්‍රධාන කාර්යයන්

01. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයන්ට අදාල තොරතුරු පවත්වාගෙන යාම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම හා සංවර්ධන කටයුතු සිදු කිරීම.
02. ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයන්හි පරිගණක දෘඩාංග පද්ධතිය ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම හා නව දෘඩාංග අවශ්‍යතා පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
03. මෘදුකාංග හා දෘඩාංග පද්ධතිය සම්බන්ධ ආයතන සමග සම්බන්ධතා කටයුතු හා අදාල යාවත්කාලීන කටයුතු සිදු කිරීම.
04. මෘදුකාංග පද්ධතියේ දත්ත සුරක්ෂිත කිරීම සඳහා පියවර ගැනීම.
    දෘඩාංග පද්ධතියේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
05. කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු වාර්තා සකස් කර ලබාදීම හා සෑම සේවා අංශයකටම අයත් තොරතුරු සන්නිවේදන පහසුකම් ඇතිකිරීම.
06. තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනයට අදාල නිර්දේශයන් ඉදිරිපත් කිරීම, පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් සිදු කිරීම.

## 1.12. 2013 වර්ෂයේ සිදුකළ කාර්යයන්

01. නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පරිගණක ජාලගත පද්ධතිය විධිමත්ව ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් කාර්යාල වෙත VPN පද්ධතිය තවදුරටත් පුළුල් කිරීම.
02. ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි පරිගණක දෘඩාංග අවශ්‍යතා සපුරාලීම හා ඉදිරි අවශ්‍යතා ඇස්තමේන්තු කිරීම.
03. Advant Technologies ආයතනය විසින් සකස් කරන ලද පරිගණක මෘදුකාංග පද්ධතියේ තවදුරටත් පවතින වැඩි දියුණු කිරීම සඳහා එම සමාගම සමග එක්ව කටයුතු කිරීම.
04. අන්තර්ජාල වෙබ් අඩවියක් ආරම්භ කිරීම (www.ssb.gov.lk) , Face book පිටුවක් ආරම්භ කිරීම.
    ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි සන්නිවේදන අවශ්‍යතා සංවර්ධනය කිරීම.
05. පරිගණක දත්ත සුරක්ෂිතභාවය ඇති කිරීම සඳහා මහජන බැංකුවේ ආරක්ෂිත සේප්පුවක් ලබා ගෙන දිනපතා තොරතුරු ගබඩා කිරීමට (Backup) පියවර ගැනීම.

### කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පරිගණක වැඩසටහන් සහකාර | 01 |
| පරිගණක ක්‍රියාකරු | 02 |

### පුරප්පාඩු තනතුරු

| | |
|---|---|
| සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ) | 01 |
| පරිගණක වැඩසටහන් සහකාර | 01 |
| දත්ත පරිපාලක | 01 |

## 2. සමාජ ආරක්ෂණ අංශය

### 2.1. ප්‍රධාන කාර්යයන්

- විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳව ප්‍රචාරණය සහ ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- යෝජනාක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- පසු වාරික මුදල් ගෙවීම සඳහා අදාල මගපෙන්වීම සිදුකර ගෙවීම් කිරීමට අදාළ පාස්පොත්, බැංකු බැරපත් ලබා දීම.
- සාමාජික ගැටළු නිරාකරණය, අක්‍රීය තත්ත්වයට පත්වන සාමාජිකයින් සක්‍රීය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.
- විශ්‍රාම වැටුප්, අර්ධ අබලතා ප්‍රතිලාභ, පූර්ණ අබලතා ප්‍රතිලාභ, මරණ පාරිතෝෂික ආදී ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ අංශය හා දිස්ත්‍රික් කාර්යාල 23 ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
- ආයතන, නිලධාරීන් හා පොදුජන සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යොජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

### 2.2. සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

- ඔප්පු සේවා, විශ්‍රාම වැටුප්, රක්ෂණ හා ප්‍රවර්ධන වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 04 ක් මඟින් සේවා කටයුතු ඉටුකරනු ලැබේ.

- 2013.12.31 වන විට මුලතිව්, හා මන්නාරම යන දිස්ත්‍රික්කවල හැර අනෙකුත් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇත.

## 2.3. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධවන නිලධාරීන්

- දිස්ත්‍රික් කාර්යාල සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්, සහයක කාර්ය මණ්ඩලය පත්කර ඇති අතර, ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බඳවාගැනීම් කටයුතු සිදුකරනු ලැබේ.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන් අනුව දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් මඟින්, ග්‍රාම නිලධාරීන් වෙත රාජකාරී විෂයක් ලෙස බලය පවරා ඇති අතර, එම නිලධාරී මඟින් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු සළස්වා ඇත.
- විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

### සමාජ ආරක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යාලයේ කාර්යය මණ්ඩලය

| තනතුර | සිටින |
|---|---|
| 1. නි.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 1 |
| 2. ස.සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) | 1 |
| 3. ස.සාමාන්‍යාධිකාරී (විශ්‍රාම වැටුප්/රක්ෂණ) | 1 |
| 4. කළමණාකරුවන්/සම්බන්ධීකරණ නිළධාරීන් | |
| a. ඔප්පු සේවා | 1 |
| b. රක්ෂණ | 1 |
| c. විශ්‍රාම වැටුප් | 1 |
| d. අලෙවි ප්‍රවර්ධන | 1 |
| e. සම්බන්ධීකරණ නිලධාරි | 1 |
| 5. කළමණාකරණ සහකාර | 8 |
| 6. කාර්යාල කාර්ය සහයක | 2 |
| **එකතුව** | **18** |

### දිස්ත්‍රික් කාර්යාල කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| 1. දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි | 37 |
| 2. කළමණාකරණ සහකාර | 15 |
| 3. කාර්යාල කාර්ය සහයක | 17 |
| **එකතුව** | **69** |

## 2.4 සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

2013 වර්ෂයේදී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමයට දිස්ත්‍රික් මටට්ටමින් බඳවාගත් නව සාමාජිකයන් පිළිබඳ විස්තර

| | දිස්ත්‍රික්කය | 20 13 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයන්) |
|---|---|---|
| 1 | කොළඹ | 47 |
| 2 | ගම්පහ | 509 |
| 3 | කළුතර | 13 |
| 4 | ගාල්ල | 23 |
| 5 | මාතර | 652 |
| 6 | හම්බන්තොට | 62 |
| 7 | රත්නපුර | 55 |
| 8 | කෑගල්ල | 54 |
| 9 | මහනුවර | 57 |
| 10 | මාතලේ | 01 |
| 11 | නුවරඑළිය | 68 |
| 12 | කුරුණෑගල | 1898 |
| 13 | පුත්තලම | 1707 |
| 14 | බදුල්ල | 1210 |
| 15 | මොණරාගල | 166 |
| 16 | අනුරාධපුරය | 55 |
| 17 | පොළොන්නරුව | 30 |
| 18 | අම්පාර | 836 |
| 19 | ත්‍රිකුණාමලය | 02 |
| 20 | මඩකලපුව | 87 |
| **21** | කිලිනොච්චිය | **706** |
| 21 | යාපනය | 540 |
| 22 | වෙනත් | 470 |
| | **එකතුව** (සාමාජිකයින්) | **9248** |

## 2.5. 20 13 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

| විස්තරය | සංඛ්‍යාව | වියදම (රුපියල්) |
|---|---|---|
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 15527 | 119,521,237.81 |
| මරණ පාරිතෝෂික ගෙවීම් | 129 | 2,491,977.92 |
| පූර්ණ ආබාධිත මාසික දීමනා | 27 | 620,584.92 |
| අර්ධ ආබාධිත පාරිතෝෂිත ගෙවීම් | 03 | 57,256.51 |
| එකතුව | | 119,820,874.62 |
| | | |

## 2.6. 20 13 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල්

| බඳවාගැනීම් සහ වාරික රැස්කිරීම් | ලැබීම් (රු.) |
|---|---|
| බඳවාගැනීම් මුල් වාරික මුදල | *6,560,247.00 |
| බැංකු මගින් රැස් කරගනු ලැබූ වාරික මුදල් | 12,543,570.69 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් රැස් කරගනු ලැබූ වාරික මුදල් | 29,734,339.23 |
| තැපැල් කාර්යාල මගින් රැස් කිරීම් | 96,215,400.31 |
| එකතුව | 149,717,984.23 |

## 2.7. 20 13 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්

| විස්තරය | සංඛ්‍යාව | වැයවූ මුදල(රු.) |
|---|---|---|
| විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන් | 10 | 74,860.00 |
| දිස්ත්‍රික් මට්ටමින් ඇගයීම් වැඩසටහන් | 01 | 44,107.00 |
| දිස්ත්‍රික් මට්ටමින් අක්‍රීය දායකයින් සක්‍රීය කිරීම් හා බඳවාගැනීම් | 81 | 438,612.00 |
| එකතුව | 92 | 557 ,579.00 |

## 2.8. සමාජ ආරක්ෂණ අංශයේ ගැටළු

- දිස්ත්‍රික් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සීමිත වීම හේතුවෙන් සෘජු මැදිහත්වීම යටතේ යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීම, බඳවාගැනීම, වාරික රැස්කිරීම සඳහා මණ්ඩලයේ සෘජු පාලනයට යටත් නොවන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට සිදුවීම.
- ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම නිසා විද්‍යුත්, මුද්‍රිත හා වෙනත් ප්‍රචාරක කටයුතු දුර්වල මට්ටමක පවතින අතර, එම හේතුවෙන් යෝජනා ක්‍රමය ප්‍රචලිත කිරීම මන්දගාමීව පැවතීම.
- පුහුණුව ලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, නව නිලධාරීන් බඳවාගැනීම හා ඔවුන් පුහුණුකර සේවයේ යෙදවීමට සිදුවීම.
- මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සමානව ක්‍රියාත්මකවන ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් නොගෙවීම හේතුවෙන් ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රවර්ධන කටයුතු වලට බාධා පැමිණීම සහ නව දායකයින් බඳවාගැනීම පහල වැටීම මෙන්ම සාමාජිකයන් වාරික ගෙවීම පැහැර හැරීම.

## 3. මුදල් අංශය

### කාර්යභාරය

- ගිණුම් පිළියෙල කිරීම සහ ගිණුම් වාර්තා නිසි අයුරින් පවත්වාගෙන යාම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් අය කර ගැනීම.
- දායකයන්ගෙන් ලබාගන්නා මුදල් ආයෝජනය කිරීම.
- දායකයන්ට මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේදී හා අනිකුත් ගෙවීම් කිරීමේදී ඒවා නිසි අයුරින් නිවැරදිව පිළියෙල කිරීම.
- බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.
- කළමණාකරණ කාර්යන් සඳහා සහ භාණ්ඩාගාරයට හා අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කළ යුතු මූල්‍ය වාර්තාවක් පිළියෙල කිරීම.
- 1971 අංක 38 දරන මුදල් පණතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අයවැය ලේඛණය පිළියෙල කිරීම.
- කළමණාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා තොරතුරු ලබාදීම.

### 3. 1. පොදු කරුණු

- සියලු චෙක්පත් ලිවීම සහ ගිණුම් සැකසීමේ කාර්ය ද වැටුප් සැකසීම ද පරිගණකගත කර ඇත. මාසිකව රුපියල් ලක්ෂ 78 ක් පමණ විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි සමූපාකාර ග්‍රාමීය බැංකු 900 ක් තුලින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.
- දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකුව, ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව තුළින් දායකයන්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක්ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.

### 3.2. මුදල් අංශයේ කාර්ය මණ්ඩලය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකරි (මු) | 1 |
| සහකාර සාමාන්‍යාධිකාරි (මු) | 1 |
| කළමණාකරු (මු) | 1 |
| මුදල් අයකැමි | 1 |
| පොත් තබන්නා | 1 |
| කළමණාකරණ සහකාර | 7 |
| **එකතුව** | **12** |

# 4. අභ්‍යන්තර විගණන අංශය

## 4.1 විෂයපථය

- අභ්‍යන්තර පාලන ව්‍යුහය සහ අධිකාරිත්ව සීමාවන් හදුනාගැනීම සහ පරිපාලන කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාර්ය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක බව ඇගයීම.
- ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය පාලනය සහ අයවැය, නීති හා රෙගුලාසිවලට දක්වා ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම.
- මෙහෙයුම් ක්‍රියාවලිය සහ ප්‍රවර්ධන කටයුතුවල කාර්යක්ෂම බව සහ සාර්ථකත්වය ඇගයීම.
- වත්කම්වල පාලනය සහ ආරක්ෂාව ඇගයීම.
- පරිගණකගත සැකසුම සහ පරිගණක පද්ධතිවල ආරක්ෂාව ඇගයීම.
- වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව නව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමම්වල ප්‍රගතිය ඇගයීම.

## 4.2 කාර්යභාරය

**මූල්‍ය හා පරිපාලන කටයුතු**

- ඊ.කියා පිරිවිතරයන් හා ඊ.කියා විස්තරයන් හා අනුමත සේකව සංඛ්‍යාව පරීක්ෂාව.
- කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව.
- කාර්ය මණ්ඩල පැමිණීම හා පිටවීම සහ නිවාඩු පරීක්ෂාව.
- සේවක සුබසාධනය හා අභිප්‍රේරණ ක්‍රියාමාර්ග පරීක්ෂාව.
- සේවක විනය පාලනය සහ විනය පාලන ක්‍රියාමාර්ග පරීක්ෂාව
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු පරීක්ෂාව.
- නඩත්තු කටයුතු හා සනිපාරක්ෂක සහ ආරක්ෂක සේවා කටයුතු පරීක්ෂාව.
- භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් සහ දායක වාරික මුදල් ලැබීම පරීක්ෂාව
- ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව.
- සියලු පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාව.
- බැංකු ගිණුම් සහ බැංකු සැසඳුම් පිළියෙල කිරීම පරීක්ෂාව
- ආයෝජන කටයුතු පරීක්ෂාව.
- ගිණුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම.

**මෙහෙයුම් කටයුතු**

- දායක බඳවා ගැනීම් හා අයදුම්පත් පරිගණකගත කිරීම හා ඔප්පු නිකුත් කිරීම සහ පරීක්ෂාව.
- වාරික අය කිරීම, ප්‍රේෂණය සහ ගිණුම්ගත කිරීම පරීක්ෂාව.
- ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පරීක්ෂාව.
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම් පරීක්ෂාව.
- ප්‍රවර්ධන කටයුතු සහ වැඩසටහන් පරීක්ෂාවට ලක් කිරීම.
- ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම.

විශේෂ විමර්ශන කටයුතු.

විශේෂ පැවරුම්.

විගණකාධිපති දෙපාර්තමේන්තු විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය

4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

- 2013 පෙබරවාරි 28
- 2013 අප්‍රේල් 23
- 2013 සැප්තැම්බර් 13
- 2013 දෙසැම්බර් 30

4.4 2013 වර්ෂයේදි ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

- පුහුණු අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සහ දීමනා ගෙවීම.
- අතිකාල දීමනා ගෙවීම.
- වැටුප් හා වේතන ගෙවීම.
- විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය.
- වත්කම් වාර්තාගත කිරීම් සහ පාලනය.
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු.
- සන්නිවේදන වියදම්.
- දායකයන් බඳවා ගැනීම, අයදුම්පත් පරිගණකගත කිරීම සහ ඔප්පු නිකුත් කිරීම.
- තොග සහ ගබඩා පාලනය.
- ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් - කළුතර දිස්ත්‍රික් කාර්යාලය.<br>- කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය.

විශේෂ පැවරුම් වාර්තා - වාහන ධාවනය, නඩත්තුව සහ පාලනය දැනුවත් කිරීම.
දිස්ත්‍රික් කාර්යාල ප්‍රගතිය පරීක්ෂාව.
සම්බන්ධීකරණ නිලධාරීන්ට යතුරුපැදි පවරා දීම.
පුද්ගලික සටහන් පොතක් සඳහා ආකෘති නිර්දේශ කිරීම.

- පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව.
- විදුලිය හා ජලය භාවිතය සහ වියදම් පරීක්ෂාව.
- දායක වාරික මුදල් ආයෝජනය.
- EPF හා ETF දායක මුදල් ගෙවීම.
- අත්තිකාරම් ලබා ගැනීම සහ පියවීම.
- මරණ පාරිතෝෂික සහ අබලතා ප්‍රතිලාභ ගෙවීම.
- ගමන් වියදම්.
- දායක වාරික මුදල් ප්‍රේෂණය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්

## 4.5 අභ්‍යන්තර විගණන අංශයේ තනතුරු සහ පුරප්පාඩු

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2013.12.31 සිටි සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| අභ්‍යන්තර විගණක | 01 | - | 01 |
| විගණන නිලධාරී | 02 | 02 | 2013.02.14 සිට |
| විමර්ශන නිලධාරී | 02 | - | 02 |

# NOTES TO THE FINANCIAL STATEMENTS FOR THE YEAR ENDED 31.12.2013

## ACCOUNTING POLICIES

## 1. CORPORATE INFORMATION

### 1.1. Domicile and Legal Form

Sri Lanka Social Security Board established by Act No. 17 of the year 1996 by the parliament of Domestic Socialist Republic of Sri Lanka which had been revised by act no.33 of the year 1999 and while expanding its are of services further, under the Ministry of Social Services and Social Welfare is at present actively functioning under the Ministry of Finance and Planning. The head office is located at No. 18, Rajagiriya Road, Rajagiriya, Sri Lanka.

### 1.2 Principal Activities and Nature of Operations

The main function of Sri Lanka Social Security Board is to certify the provision of a monthly pension and social security benefits for those citizen of Sri Lanka who are not entitled a government pension and through this system of pension and social security benefits scheme, arrangements are well instituted for the payment of a monthly pension, partial and total incapacitation benefits and death gratuity.

### 1.3 The Number of Employees

The number of employees at the end of the year was 134

## 2 BASIS OF PREPARATION

### 2.1 Statement of Compliance.

The financial statements of Sri Lanka Social Security Board comprise the Statement of Financial Position, Statement of Financial Performance, Cash Flow Statement, and notes to the financial statements. These statements are prepared in accordance with the Sri Lanka Public Sector Accounting Standards (SLPSAs) laid down by the Institute of Chartered Accountants of Sri Lanka (ICASL).

### 2.2. Basis of Measurement

The financial Statements have been prepared on the historical cost Basis.

No adjustments have been made for inflationary factors in the financial statements

### 2.2 Functional and presentation Currency.

These financial Statements are presented in Sri Lankan Rupees, which is the Sri Lanka Social Security Board functional currency.

## 3 SIGNIFICANT ACCOUNTING POLICIES

These accounting policies set out bellow have been applied consistently to all periods presented in these financial statements.

### 3.1. Property, Plant and Equipment

The cost of Property, plant and equipments is the cost of acquisition or construction together with any expenses incurred in bringing the asset to its working condition for its intended use. Subsequent to the initial recognition as an asset at cost, revalued assets are carried at revalued amount less any subsequent deprecation thereon. All other Property, Plant and Equipments are stated at cost less accumulated depreciation. Where an item of Property, plant and equipments comprises major components having different useful lives, they are accounted for as separate item of Property, plant and equipments.

The asset's residual values, useful lives and methods of depreciation are reviewed, and adjusted if appropriate, at each financial year end.

**Property, Plant and Equipment- Received as Grant**

Property, Plant and Equipment acquired under any grant are capitalized at cost.

Property, Plant and Equipment other freehold land are stated at cost less accumulated depreciation. Free hold land is stated at cost.

Depreciation is charged on all Property, Plant and Equipment other than freehold land to write off the cost over the estimated useful lives.

Depreciation has been provided for the year on pro-rata basis.

Property, Plant and Equipment are depreciated on straight line method as mentioned below, further, that the all Property, Plant and Equipment have been accounted at cost method as prescribe in the **SLPSAS 7 – Property, Plant & Equipment**.

| | |
|---|---|
| 1. Motor vehicles | 20% - p.a. |
| 2. Plant Machinary & Equipment | 25% |
| 3. Computer and other fixed assets | 25% |
| 4. Communication | 20% |
| 5. Furniture & Office Equipment | 10% - p.a. |
| 6. Building | 4% p.a. |
| 7. Others | 10%. |
| 8. Soft Ware | 25% |

An item of Property, Plant and Equipment is derecognized upon disposal or when no future economic benefit is expected from its use or disposal. Any gain or loss arising on de-recognition of the asset. (Calculated as the difference between the net disposal proceeds and the carrying amount of the asset) is included in the income statement in the year the asset is derecognized.

Expenditure incurred on repairs or maintenance of Property, Plant and Equipment in order to restore or maintain the future economic benefit expected from originally assessed standard of performance is recognized as an expense when incurred.

**3.2 Inventories**

The inventories used during the financial year had been charged to the income & expenditure statement at cost.

Balance stock has been valued at cost, selling price or net realizable value whichever is lower.

**3.3. Short Term Investment**

Investments in money market instruments with a maturity less than one year are treated as short term investment and are stated at cost.

**3.4. Cash and Cash equivalents**

Cash and cash equivalents comprise cash in hand and held at bank.

**3.5. Cash flow Statement**

Cash flow Statement has been prepared using the indirect method.

**3.6. Liabilities and Provisions**

Liabilities are recognized in the balance sheet when there is a present obligation as a result of past events, the settlement of which is expected to result in an outflow of resources embodying economic benefits. Obligations payable at the demand of the creditors or within one year of the balance sheet date are treated as current liabilities in the Balance sheet.

Provision is recognized if, as a result of a past event, the Sri Lanka Social Security Board has a present legal or constructive obligation that can be estimated reliably, and it is probable that an outflow of economic benefit will be required to settle the obligation.

**3.7. Taxation**

Tax expenses reported in the financial statement and computed in accordance with the provision of the Inland Revenue Act No.10 of 2006 and its amendments thereto.

**3.8 Employee Benefits**

**I. Define Contribution Plan.**

Obligation to define contribution plan are recognized as an expenses in the income statement as incurred. The Sri Lanka Social Security Board contributes 12% and 3% of gross emoluments of employees to Provident Fund and Trust Fund respectively.

**II. Define Benefit Plan**

Gratuity is a define benefit plan. The Sri Lanka Social Security Board is liable to pay gratuity in terms of the relevant statute. In order to meet this liability , a provision is carried forward in the balance sheet, equivalent to an amount calculated base on a half month's salary of the last of the financial year of all employees for each completed year of service, commencing from the first year of service.

Provision is made for retirement gratuity for all employees in respect of gratuity payable under the payment of gratuity Act No. 12 of 1983. This item is grouped under non current liabilities in the balance sheet.

According to The Treasury, a fund is not necessary, as they will grant the funds when required.

**3.9. Revenue Recognition**

**3.9.1 Revenue Recognition**

Enrolment fees and premium from contributors are accounted on receipt basis whilst interest and all other income is accounted on accrual basis.

**3.9.2 Expenditure**

All expenditure incurred in the running of the board has been accounted on accrual basis and all expenditure incurred in the acquisition, extension or improvement of assets of a permanent nature in order to carry on or increase the earning capacity of the Board has been treated as capital expenditure.

**3.10. Comparative information**

Where necessary, comparative figures have been rearranged to conform to the current year presentation.

**3.11. Events occurring after balance sheet date**

All material post balance sheet events have been considered and where appropriate adjustment or disclosures have been made in respective note to the financial statement.

**3.12. Commitments and contingencies**

Contingencies are possible assets or obligations that arise from a past event and would be confirmed only on the occurrence or non-occurrence of uncertain future events, which are beyond the Sri Lanka Social Security Board's control.

3.13. Accounting of Grants

i. Government Grants

The accounting policy adopted for Government Grants including the methods of presentation are as follows.

a. Government Grants for purchase of assets are recognized as income over the periods of useful life of the assets.

b. Other grants received from Fund as well as expenses thereon have been incorporated in the Profit & Loss.

**3.14 Investment**

Investment in fixed deposit and short term deposit has been stated at cost. Income from such investments has been accounted on accrual basis.

**3.15 Funds**

Social Security Development Fund is created by total collection from persons who exceeded 60 years of age and paid only less than 25% of their due contribution.

Social Security Incentive Fund is created on the basis of incentive payable for the relevant year.

Social Security Pension Fund and Social Security Insurance Fund is created on the basis of 85% & 15 % respectively on remained fund collection after allocating to the above funds.

**3.16. Previous Year Adjustments**

Provision for depreciation of assets up to 31.12.2012 has been adjusted for differed revenue as per Accounting Standard.

# SRI LANKA SOCIAL SECURITY BOARD
## STATEMENT OF FINANCIAL POSITION
## AS AT 31. DECEMBER 2013

| | NOTE | 2013 Rs | 2012 Rs |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **NON CURRENT ASSETS** | | | |
| PROPERTY PLANT & EQUIPMENT | 9 | 238,003,612 | 38,236,459 |
| INVESTMENT | 10 | 1,622,672,141 | 1,519,418,628 |
| **TOTAL** | | **1,860,675,753** | **1,557,655,087** |
| **CURRENT ASSETS** | | | |
| CASH IN HAND AND BANK | 11 | 3,978,759 | 12,700,186 |
| DEPOSITS | 12 | 75,000 | 75,000 |
| ADVANCES | 13 | 6,900 | 17,000 |
| STAFF LOAN | 14 | 3,058,711 | 3,500,420 |
| OTHER ASSETS | 15 | 118,029,324 | 189,133,231 |
| **TOTAL CURRENT ASSETS** | | **125,148,694** | **205,425,837** |
| **TOTAL ASSETS** | | **1,985,824,447** | **1,763,080,924** |
| LESS: | | | |
| **LIABILITIES** | | | |
| **CURRENT LIABILITIES** | | | |
| BANK OVERDRAFTS | | - | 20,708,353 |
| OTHER LIABILITIES | 16 | 25,003,080 | 33,553,641 |
| **TOTAL CURRENT LIABILITIES** | | **25,003,080** | **54,261,994** |
| **NET CURRENT ASSETS** | | **100,145,614** | **151,163,842** |
| **NON CURRENT LIABILITIES** | 17 | **12,521,173** | **9,996,978** |
| **TOTAL LIABILITIES** | | **37,524,252** | **64,258,972** |
| **TOTAL NET ASSETS** | | **1,948,300,195** | **1,698,821,952** |
| **FINANCED BY** | | | |
| ACCUMILATED FUND | 18 | (10,586,588) | (70,729,807) |
| S.L. SOCIAL SECURITY PENSION FUND | 19 | 1,417,904,895 | 1,429,799,740 |
| S.L. SOCIAL SECURITY INSURANCE FUND | 20 | 285,561,224 | 261,911,666 |
| S.L. SOCIAL SECURITY INCENTIVE FUND | 21 | 2,635,632 | 624,618 |
| S.L. SOCIAL SECURITY DEVELOPMENT FUND | 22 | 8,584,323 | 4,494,782 |
| S.L. SOCIAL SECURITY ELDERS FUND | 23 | 2,396,025 | 2,547,023 |
| GOVERNMENT & FUND GRANTS | 24 | 241,804,683 | 70,173,930 |
| **Total Equity** | | **1,948,300,195** | **1,698,821,952** |

The Accounting Policies and Notes appearing on pages 10 to16 form an integral part of the financial statements

| | | |
|---|---|---|
| H.L.S Wijesinghe | Dhammika Padukka | Attorny, H.W.Sumana Ariyadasa |
| Deputy General Manager (Fin) | General Manager (Atg) | Chairman |

## SRI LANKA SOCIAL SECURITY BOARD
